**මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම - 2018**

---

## 1.1 මතය වියාචනය

මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ වියාචනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 33 ඡේදය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේදී ස්ථාවර තැන්පතු මත ලද පොළී ආයෝජන ක්‍රියාකරකම්වලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවද සමාගමට සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු. 30,472,055 ක පොළී ආදායම මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | එකඟ වේ.<br><br>ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 හි 09 හා 12 වගන්ති අනුව සමාගමෙහි මෙහෙයුම් | එකඟ වේ.<br>මාගම්පුර වරාය කළමනාකරණ (පුද්) සමාගම චීන සමාගමකට බදු දීමත් | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කළමනාකරණය |

| | | |
|---|---|---|
| කටයුතු නතර කර ඇති බැවින් සමාගම සතු පිරිවැය රු. 1,144,830 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් හානිකරණයක් ඇත්දැයි සොයා බලා අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතු වුවද සමාගම විසින් ඉහත අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | සමඟ එහි ඉතිරිව තිබූ සියළුම ලිපිගොනු සහ පිරියත උපකරණ කොළඹ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මහපොළ ආයතනය වෙත රැගෙන එන ලදී. එසේ ගෙන එනු ලැබූ වත්කම් වලින් කුඩා මුද්‍රණ යන්ත්‍රයක් (Printer) පමණක් මහපොළ ආයතනය තුල ඇති බව එම භාණ්ඩ භාරව සිටින ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නියෝජ්‍ය කළමනාකරුවෙකු සඳහන් කරන ලදී. මේ වන විට කළමනාකාර අධ්‍යක්‍ෂක වරයෙකු නොමැති බැවින් ඉදිරියේදී නව කළමනාකාරීත්වයක් පත් වූ පසුව සුදුසු ක්‍රියාමාර්ගක් ගැනීමට කටයුතු කරණු ඇත. | කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.7 අනුව සමාගම සතු තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගයට පෙන්නුම් කරන බව දක්වා තිබුණද මූල්‍ය ප්‍රකාශ අනුව රු. 12,430,943 ක් වූ තොග වටිනාකම තහවුරු කර ගැනීම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. | එකඟ වේ.<br><br>තොග වටිනාකම වන රු. 12,430,943.00 ආයතනයේ භෞතිකව නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශ වලින් කපා හැරීම සඳහා 2019.8.16 වන දින පැවති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේ දි තීරණය කරන ලදී. මේ අනුව මෙම ලැබිය යුතු මුදල් සහ තොග වල වටිනාකම කපා හැරීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමා හරහා මුදල් අමාත්‍යාංශය වෙත 30.10.2019 වන දින ලිපියක් යොමු කර ඇත. තව ද 20.11.2019 දින පැවති සාකච්ඡා වේ දී වරාය අධිකාරිය මගින් interlock blocking, crusher chips stocks & fuel stocks පිළිබඳව කටයුතු කර ඇති අතර මේ පිළිබඳව වරාය අධිකාරියෙන් වැඩිදුර විමසීම සුදුසු බව දන්වමි. | වාර්ෂාවසානයට තොග සත්‍යාපන වාර්තා ලබා ගෙන ඒ අනුව තොග ශේෂවලට අවශ්‍ය ගැලපුම් සිදු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහජන බැංකුව වෙත සෘජු ප්‍රේෂණයන් ලෙස 2018 මාර්තු 26 දින ලැබී තිබූ රු. 54,000 ක් හා 2018 අගෝස්තු 11 දින ලැබී තිබූ රු. 200,000 ක් බැංකු ප්‍රකාශනයෙහි බැර වී තිබූ නමුත් එම මුදල් නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව වෙනත් වියදම් ගිණුමට බැර කර තිබුණි. මේ හේතුවෙන් වෙනත් වියදම් ගිණුම රු. 254,000 කින් ඌන ගණනය වී තිබුණි. | එකඟ වේ.<br>එම සෘජු ප්‍රේෂණවලට අදාල කිසිදු මූලාශ්‍ර/උපකාරක ලියවිල්ලක් සොයාගැනීමට නොහැකි වූ බැවින් එම සෘජු ප්‍රේෂණ වෙනත් වියදම් ගිණුමට බැර කරන ලදී. පසුව ලැබුනු ලියවිලි මත මෙම රු. ලක්ෂ දෙකක සෘජු ප්‍රේෂණය සමාගමේ ලේකම් තනතුර දරන නිලධාරිනිය විසින් තැන්පත් කරන ලද චෙක් පත බව හඳුනා ගන්නා ලදී. | බැංකුව වෙත ලැබී ඇති මුදල් නිශ්චිතව හඳුනාගැනීමෙන් පසු ගිණුම් තැබීම සිදු කල යුතුය. |

### 1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2017 නොවැම්බර් 13 දින සිට සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අතර 2018 පෙබරවාරි 15 දින සමාගම ඈවර කිරීම සඳහා අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් තීරණය කර තිබූ නමුත් 2019 නොවැම්බර් 20 දින වනවිටත් සමාගම ඈවර කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. එදින වනවිටත් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ නිලධාරීන් 07 ක් සේවයේ යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ සමුච්චිත ශුද්ධ අලාභය රු. මිලියන 2,871 ක් වූ අතර එදිනට සමාගමේ ශුද්ධ වත්කම්වල වටිනාකම රු.මිලියන 2,795 ක සෘණ අගයක් නිරූපණය කෙරුණි. | 2018 ජූලි 19 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ආයතනය ගණන් බේරා වසා දැමීමේ කටයුතු පිලිබඳ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් කිරීමට තීරණය කොට ඇත. තව ද, 2018.3.12 සහ 2018.8.10 යන දිනැති ලිපි මගින් සභාපති, මාගම්පුර කළමනාකරණ සමාගම විසින් සභාපති, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත මේ සඳහා කඩිනමින් පියවර ගන්නා මෙන් දන්වමින් ලිපි දෙකක් යොමුකර ඇත. මේ අනුව සමාගම ඈවර කිරීමේ වගකීම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වේ. | සමාගම ඈවර කිරීමට තීරණය කර ඇති බැවින් එය කඩිනමින් ක්‍රියාත්මක කිරිමට වගකිව යුතු නිලධාරීන් ක්‍රියාකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) සමාගම විසින් 2014 වර්ෂයේදී නැව් තෙල් මිලදී ගැනීම සඳහා දේශීය පෞද්ගලික බැංකුවකින් රු.3,144,178,059 කට සමාන එක්සත් ජනපද ඩොලර් 24,002,438 ක ණය ලබා ගෙන තිබුණු අතර මූල්‍ය ප්‍රකාශ අනුව 2018 වර්ෂය සඳහා රු.224,527,701 ක් වූ පොළී මුදලද ඇතුලත්ව ආපසු ගෙවිය යුතු මුළු ණය ශේෂය රු. 4,025,917,925 කට සමාන එ.ජ.ඩො. 22,029,646 ක් විය. මෙම ණය ශේෂය, ශේෂ සනාථන ලිපි මගින් අදාල බැංකුව තහවුරු කර නොතිබූ අතර ඒ හේතුවෙන් මෙම ශේෂයෙහි නිවැරදිතාවය පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැවතුණි. තවද සමාගම විසින් 2018 වර්ෂය තුළදී ණය හෝ පොළී මුදල් කිසිවක් ආපසු ගෙවා නොතිබුණි. එසේම මෙම ණය මුදල පියවීමට ආයතනය සතු වත්කම් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ අතරම ණය ආපසු ගෙවීම් සඳහා වූ වැඩ පිළිවෙලක්ද ආයතනය සතුව නොතිබුණි. | එකඟ වේ.<br><br>ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් අදාල බැංකුව සමඟ ඉහළ මට්ටමේ සාකච්ඡා පවත්වමින් ඇත. | ණය හා පොළිය පිළිබඳව අදාල පෞද්ගලික බැංකුව සමග සාකච්ඡා කර අවසන් විසඳුමකට පැමිණීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

**1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

-----------------------------------------------

පහත සඳහන් එක් එක් විෂයයක් සම්බන්ධයෙන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | - | | |
| හැටන් නැෂනල් බැංකු ඩොලර් ගිණුම (HNB – Dollar Balance) | 23,266 | ශේෂ සනාථන ලිපි | හැටන් නැෂනල් බැංකුව මගින් ශේෂ සනාථන ලිපි ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී. | බැංකුව සමඟ සාකච්ඡාකර ගැටලු විසඳා ගැනීමට කටයුතු කල යුතුය. |
| හැටන් නැෂනල් බැංකු ණය ශේෂය (HNB – Loan Balance) | 3,440,570,990 | ශේෂ සනාථන ලිපි | හැටන් නැෂනල් බැංකුව මගින් ශේෂ සනාථන ලිපි ලබාදීම ප්‍රතික්ෂේප | බැංකුව සමඟ සාකච්ඡාකර ගැටලු විසඳා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරන ලදී. | |
| හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා සමාගමෙන් ලැබිය යුතු මුදල | 17,782,563 | ශේෂ සනාථන ලිපි, උපකාරක ලියවිලි හා වයස් විශ්ලේෂණ වාර්තා | හම්බන්තොට ජාත්‍යන්තර වරාය සේවා සමාගමෙන් ලැබිය යුතු මුදල 17,782,563 මේ සඳහා ලැබිය යුතු මුදල 2019.08.16 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මූල්‍ය ප්‍රකාශ වලින් කපා හැරීමට තීරණය කරන ලදි. | සමාගම වෙත ලැබිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව අය කර ගැනීමට කළමනාකරණය ක්‍රියාකල යුතුය. |
| නැව්තෙල් සඳහා ලැබිය යුතු ශේෂය (Insurance Receivable for bunkering) | 28,040,453 | ශේෂ සනාථන ලිපි, උපකාරක ලියවිලි හා වයස් විශ්ලේෂණ වාර්තා | මෙය මූල්‍ය ප්‍රකාශ වලින් කපා හැරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ලැබිය යුතු දෑ අයකර ගැනීම ප්‍රමාද වීමට හේතු සොයාබලා ඒවා අය කර ගැනීමට කළමනාකරණය කඩිනමින් ක්‍රියාකල යුතුය. |
| අනිකුත් ණයගැතියන් | 3,589,879 | ශේෂ සනාථන ලිපි, උපලේඛණ, උපකාරක ලියවිලි හා වයස් විශ්ලේෂණ වාර්තා | අනෙකුත් ණයගැතියන් 3,589,879 මෙය මූල්‍ය ප්‍රකාශ වලින් කපා හැරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | ලැබිය යුතු දෑ අයකර ගැනීම ප්‍රමාද වීමට හේතු සොයාබලා ඒවා අය කර ගැනීමට කළමනාකරණය කඩිනමින් ක්‍රියාකල යුතුය. |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 15,591,171 | උපලේඛණ, උපකාරක ලියවිලි හා වයස් විශ්ලේෂණ වාර්තා | අනෙකුත් ගෙවිය යුතු දෑ 15,591,171 මෙම අගය තුල වන්දි මුදල් නොගත් සේවකයන් සඳහා රු. 14,323,749/- ක් ද අවුරුද්ද අවසානයේ අනෙකුත් ගෙවිය යුතු දෑ සඳහා වෙන් කරන ලද වියදම් ද මෙහි ඇතුලත්ය. | සමාගම විසින් ගෙවිය යුතු දෑ සඳහා ගෙවීම් ප්‍රමාද කිරීමේදී අතිරේක ගාස්තු අයකල හැකි බැවින් අදාල ගෙවිය යුතු දෑ ප්‍රමාදයකින් තොරව ගෙවීමට කළමනාකරණය ක්‍රියාකල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය රු. 3,021,258 ක් වූ අතර මෙම රඳවා ගැනීම් බදුවලට අදාල බදු සහතිකපත් විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට ද ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය රු. 2,985,798 ක් විය. දැනට සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර ඇති බැවින් ඉහත රඳවා ගැනීමේ බදු මුදල් ආදායම් බදු ගෙවීමේදී අඩු කර ගැනීම පිළිබඳව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | එකඟ වේ.<br><br>2018 වසර තුල ආයතනයෙහි මෙහෙයුම් කටයුතු කිසිවක් සිදුනොවූ බැවින් කිසිදු ආදායමක් නොමැති බැවින් ආදායම් බදු වගකීමක් ද නොමැත. | ශේෂය පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළමණාකරණයේ වගකීම වේ. |
| (ආ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු. 103,666,952 ක් දක්වා තිබුණ ද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට සමාගමට ගෙවිය යුතු ශේෂය රු. 71,819,156 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව 31,847,796 ක වෙනසක් නිරීක්‍ෂණය විය. එසේම ඉහත ලැබිය යුතු ශේෂයෙන් රු. 37,648,717 ක ශේෂයක් සඳහා ශේෂ සනාථන ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. ඉහත ශේෂ සනාථන නොලද ශේෂය තුල අන්තර්ගත රු 25,719,981 ක් වූ වග් යාත්‍රා වන්දි මුදල ලැබීම අවිනිශ්චිත බව නිරික්ෂණය වූ නමුත් ඒ සඳහා ගිණුම් වල හානිකරණ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් රු.66,018,234.45 ක් මාගම්පුර වරාය කළමනාකරණ සමාගමට ගෙවිය යුතු බව දන්වා ශේෂ සනාථන ලිපියක් එවා ඇත. මෙම රු.මිලියන 66 බදු රහිතව පෙන්වා ඇති අතර අප සමාගමේ මෙම අගය බදු සහිතව පෙන්වා ඇත. එවිට බදු සහිත අගය රු.76,547,855 වේ. තව ද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගෙවිය යුතු ඉන්ධන වියදම රු1,399,116/- ක් සහ මගී යාත්‍රා වන්දි මුදල වන රු.25,719,981/- ක් ද මෙම ශේෂයට ඇතුලත්ය. | ශේෂ සනාථන ඉදිරිපත් නොකල ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් ඒවා ලැබීමට හෝ නොලැබීමට ඇති හැකියාව සොයා බලා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව හානිකරණ ප්‍රතිපාදන සිදු කිරීමට කළමනාකරණය ක්‍රියාකල යුතුය. |
| (ඇ) | 2014 ජුනි 22 දින හම්බන්තොට වරායට පැමිණි නෞකාවක් වෙත එක්සත් ජනපද ඩොලර් 63,500 ක ඉන්වොයිස් වටිනාකමකින් යුතු (IFO) 380 ඉන්ධන මෙට්‍රික් ටොන් 102.42 ක් විකුණා තිබු අතර අදාල නියෝජිත ආයතනය විසින් එම ඉන්ධන සඳහා වූ මුදලින් එක්සත් | එකඟ වේ.<br><br>ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශණ වලින් කපා හැරීමට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | අදාල නැව් නියෝජිත ආයතනය සමග සාකච්ඡා කර සමාගම වෙත ලැබිය යුතු මුදල් අය කර ගැනීමට හෝ වෙනත් සුදුසු |

| | | | |
|---|---|---|---|
| | ජනපද ඩොලර් 47,870.40 ක මුදලක් මාගම්පුර වරාය කළමනාකරණ සමාගම ගෙවා තිබුණි. නමුත් ඉතිරි මුදල වූ එක්සත් ජනපද ඩොලර් 15,630 ක් එනම් රු. 2,396,079 ක මුදල 2018 දෙසැම්බර් 31 දින වන විටදීත් සමාගමට ලැබී නොතිබුණි. කෙසේ වුවද 2018 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් ලැබිය යුතු එම සම්පූර්ණ මුදල සඳහාම අඩමාන ණය වෙන් කිරීමක් සිදු කර තිබුණි. | | ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කල යුතු වීම. |
| (ඈ) | 2016 මාර්තු සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාලව මාගම්පුර වරාය කළමනාකරණ සමාගම් පරිශ්‍රයේ පිහිටි ඉන්ධන පිරවුම්හලෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් වාහන සඳහා නිකුත් කර තිබූ රු. 1,399,115 ක වටිනාකමින් යුත් ඩීසල් හා පෙට්‍රල් ඉන්ධන ලීටර් 11,449 ක ප්‍රමාණයට අදාල මුදල 2018 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබුණි. | එකඟ වේ. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්තා ගත හා අනුමත ප්‍රමාණයන් සඳහා වරාය අධිකාරිය විසින් ගෙවීමට කටයුතු කරනු ඇත. | සමාගමට ලැබිය යුතු මුදල් ප්‍රමාදයකින් තොරව අය කර ගැනීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය i.6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගමේ 2018 වර්ෂයේ ගිණුම් ප්‍රකාශ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුනේ 2019 සැප්තැම්බර් 18 දිනදීය. තවද, කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ.<br><br>මාගම්පුර වරාය කළමනාකරණ සමාගමේ මූල්‍ය කළමනාකරු සහ ගිණුම් සහායක 2018 දෙසැම්බර් සිට ඉල්ලා අස්වීම සහ අර්ධකාලීන සේවය සඳහා මූල්‍ය කළමනාකරුවකු පත්කරන ලද්දේ 01.4.2019 වන දින සිටය. එබැවින් 2018 වසරේ ගිණුම් සැකසීම ප්‍රමාද විය. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව මූල්‍ය වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ආ) | 2015 ජූනි 17 දිනැති අංක පීඊඩී3/2015 දරණ | i. රජය සතු පරිපාලිත සමාගම්වල සභාපතිවරයා වෙත මාසික දීමනා ගෙවීමේදී ඊර්ෂිය අමාත්‍යාංශයේ | 1 සහ 2 එකඟ වේ. ඉදිරියේ දී අදාල අනුමැතියන් ලබා | විධිමත් අනුමැතියකින් තොරව ගෙවන |

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.2 වගන්තිය | ලේකම්තුමාගේ නිර්දේශය සහ මුදල් අමාත්‍යතුමාගේ එකඟතාවය ලබා ගත යුතු වුවද සමාගම විසින් ඉහත පරිදි නිර්දේශ ලබා ගැනිමකින් තොරව සභාපතිවරයාහට මාසිකව රු. 125,000 ක් බැගින් ගෙවා තිබුණි. | ගැනීමට කටයුතු කරනු ඇත. | ලද මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| | ii. සමාගමේ පාලක මණ්ඩල රැස්වීම් දීමනා ගෙවීම සඳහා ඉහත (i) හි පරිදි නිර්දේශය හා එකඟතාවය ලබා ගත යුතු අතර "ඒ" (A) පන්තියේ රජය සතු ව්‍යාපාර සඳහා ගෙවනු ලබන උපරිම දීමනාව රු. 12,500 ක් වේ. එසේ වුවද, සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කර තිබූ 2018 හා 2019 වර්ෂ වලදී රැස්වීම් 14 ක් පවත්වා තිබූ අතර එම රැස්වීම් සඳහා සහභාගි වූ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත එක් වරකදී රු. 25.000 ක් බැගින් අදාළ වර්ෂ සඳහා පිළිවෙලින් රු. 650,000 ක් රු. 1,100,000 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. | | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 801,559,524 ක පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 109,286,876 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 692,272,648 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ශ්‍රී ලංකා රජය මගින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| ආදායම | - | 1,114,042,732 |
| සෘජු වියදම් | (6,805,801) | (456,516,287) |

| | | |
|---|---|---|
| පරිපාලන වියදම් | (41,722,417) | (583,475,699) |
| | ------------------- | ----------------- |
| මෙහෙයුම් ලාභය/අලාභය | (48,528,218) | 74,050,746 |
| ශුද්ධ මූල්‍ය පිරිවැය | (194,055,646) | (102,622,158) |
| විදේශ විනිමය අලාභය | (558,975,660) | (72,689,790) |
| | ------------------ | ---------------- |
| බදු පෙර ශුද්ධ ලාභය | (801,559,524) | (101,261,202) |
| ආදායම් බදු | - | (8,025,674) |
| බදු පසු ශුද්ධ ලාභය | ------------------ | ------------------- |
| | (801,559,524) | (109,286,876) |
| | =========== | ============ |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින අවසන් කර තිබීම හේතුවෙන් 2018 වර්ෂයේ සමාගමට ආදායම් ලැබී නොතිබුණි.

ii. 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ මූල්‍ය පිරිවැය රු. 91,433,488 කින් හෙවත් සියයට 89 කින් වර්ධනය වී තිබුණි.

iii. 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය අලාභය රු. 486,285,870 කින් හෙවත් සියයට 669 කින් වර්ධනය වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| | **2018** | **2017** |
|---|---|---|
| | -------- | ---- |
| ජංගම වත්කම් අනුපාතය | 0.31:1 | 0.45:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.31:1 | 0.40:1 |
| මෙහෙයුම් ලාභ අනුපාතය | - | 6.6% |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. 2017 වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 0.45:1 ක් හා 0.40:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය පිළිවෙලින් 0.31:1 ක් හා 0.30:1 ක් ලෙස අඩු වී තිබුණි.

ii. 2017 වර්ෂයේ මෙහෙයුම් ලාභ අනුපාතය 6.6 % ව පැවතුණු අතර 2018 වර්ෂයේ මෙහෙයුම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් මෙහෙයුම් ලාභයක් ගණනය කල නොහැකිය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කල පසු, කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබූ නිලධාරින් 07 දෙනෙකු වෙනුවෙන් 2018 පෙබරවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා රු.12,809,011 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එහෙත් මූල්‍ය කළමනාකරුගේ හැර අනිකුත් නිලධාරීන්ගේ පත්වීම් ලිපි, රාජකාරී පිළිබඳ විස්තර හා කළවැඩ වාර්තා පිළිබඳ විස්තර සහ සියලු නිලධාරීන්ගේ පැමිණීමේ ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. මේ හේතුවෙන් එම නිලධාරීන් ඉටුකල කාර්යභාරයේ ප්‍රමාණය මතභේදාත්මක වේ.<br><br>තවද අංක MPMC/01/2018 හා 2018 ජනවාරි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මාස 06ක කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනමට මෙම නිලධාරීන් බඳවා ගෙන තිබුණද කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමකින් තොරව මාස 05ක් රඳවා ගෙන අදාළ කාලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 5,543,005 ක් ගෙවා තිබුණි. | එකඟ වේ.<br>අදාල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් මාස හයකට පත්වීම් ලබා දීමට ඉල්ලුම් කර දී තිබුන ද අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුනේ ඇවර කරුවකු පත්කරන තෙක් පත්වීම ලබා දීමටය. කොන්ත්‍රාත් පදනම මත මෙම සේවකයින් 7 දෙනා බඳවා ගැනීමට අදාල 2018.02.15 දින ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තිරණයකට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම, ලෙජර් ගිණුම් පවත්වාගෙන යාම සහ සේවක වන්දි ගෙවීමේ කටයුතු ඉටු කිරීම සඳහා ඔවුන්ගේ පත්වීම්, ලබාදෙන ලදී<br><br>කාර්මික බේරුම්කරන අංක A-37-2017 දරණ නඩුවේ පාර්ශ්ව කරුවන් අතර ඇතිකරගන්නා ලද සමථ කොන්දේසි මත මෙම නිලධාරීන් 7 දෙනාගේ වැටුප් හා දීමනා ගෙවා ඇත. තවද මෙම ගෙවීම් එකල ඉහළ කළමනාකාරීත්වයේ අනුමැතිය ඇතිව ගෙවා ඇත. | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන්ට ගෙවීම් සිදු කිරීමේදී පැමිණීමේ වාර්තා සහ කල වැඩ වාර්තා පරීක්ෂාවට භාජනය කර අදාල ගෙවීම් සිදු කිරීමට කළමනාකරණය ක්‍රියා කල යුතුය. එසේම බඳවාගත් කොන්ත්‍රාත් කාලය ඉක්මවා ඇත්නම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන කාලය දීර්ඝ කිරීමට ක්‍රියා කල යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට රු. 173,727 ලෙස දක්වා තිබූ සුළු මුදල් ශේෂය 2019 සැප්තැම්බර් 30 දින දක්වාම පොත්වල පැවති නමුත් සමාගම සතුව භෞතිකව එම මුදල් නොපැවතුණි. | එකඟ වේ. 2019.4.01 දින මාගම්පුර වරාය කළමනාකරණ (පුද්) සමාගම සතුව තිබූ වවුචර් පත් ලිපිගොනු සහ අදාල ලිපිගොනු භාර ගන්නා අවස්ථාවේ දී ද ආයතනය සතුව භෞතිකව රු.174,479 ක් ලෙස පැවතුනු සුළු මුදල් ශේෂයක් නොතිබිනි. මෙය 2017 වසරෙහි ගිණුම් වල ද පෙන්නුම් කල තත්වයක් බැවින් එවකට සිටි මූල්‍ය කළමනාකරු සතු වගකීමක් බව පෙනීයයි | මුදල් ශේෂය නොමැතිවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීමට කළමනාකරණය විසින් ක්‍රියා කල යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සේවකයන් වන්දි ගෙවා ඉවත් කිරීමේදී ඇති වූ ආරවුල් සහගත තත්වය කම්කරු දෙපාර්තමේන්තුවේ කොළඹ කාර්මික අධිකරණයේ කාර්මික බේරුම්කරණ අංක A/37/2017 දරන තීරණය සහ 2018 පෙබරවාරි 02 දින පාර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ කොන්දේසිවලට එකඟ වීම මත අවසන් කර තිබුණි. සමථ ගිවිසුමේ කොන්දේසි අංක 18 (ආ) අනුව 2017 නොවැම්බර් මාසය සඳහා හිඟ අතිකාල දීමනා සහ/හෝ 2018 ජනවාරි දක්වා හිඟ වැටුප් ගෙවිය යුතුව ඇත්නම්, එම ගෙවීම් 2018 පෙබරවාරි මස 28 වන දිනට පෙර ගෙවා නිම කළ යුතු බවට එකඟ වී තිබුණි. මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් එම එකග වූ කොන්දේසිවලට පටහැනිව සමාගමේ මෙහෙයුම් අක්‍රියව පැවතීම නිසා ගෙවීමට හිමිකමක් නොමැති වූ 2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි මාසයන්ට අදාලව ගමන් වියදම්, නවාතැන් දීමනා, කාර්යසාධන දීමනා හා වාහන දීමනා ලෙස රු. 12,211,073 ක් වූ වෙනත් දීමනාවන් සමාගමේ සේවකයන් වෙත ගෙවා තිබුණි. | එකඟ වේ. මෙය 2017 වසරේ මූල්‍ය ප්‍රකාශ විගණනයේ දක්වා තිබුන ද 2018 වසරේ සිටි කළමනාකාරිත්වය ද මේ සඳහා පියවරක් ගෙන නොමැති බව පෙනී යයි. තව ද 2019 මාර්තු මස සිට නව කළමනාකාරිත්වයක් පත් කරන ලද අතර 2017 සහ 2018 වසර වලට අදාල බොහෝ ලිපිගොනු සොයා ගැනීමට ද අපහසු වී තිබේ. 2017, 2018 වසර වලට අදාලව කරන ලද මෙම වියදම් නැවත අය කරගැනීම සඳහා මෙම සමාගමේ සේවකයින් කිසිවෙක් මේ වන විට නොමැත. | වන්දි මුදල් ගෙවීමේදී සමථ කොන්දේසි අනුව කටයුතු කල යුතුය. එම කොන්දේසිවල පටහැනිව යම් ගෙවීමක් සිදු කර ඇත්නම් අදාල ගෙවීම්වලට වගකිවයුතු නිලධාරීන්ගෙන් ඒවා ආපසු අය කර ගැනිමට කළමනාකරණය ක්‍රියාකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මේ පිළිබඳව 2017 වර්ෂයේ විගණන වාර්තා මගින්ද පෙන්වා තිබූ නමුත් වැඩිපුර ගෙවීම් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ආ) | කළමනාකරණ අධ්‍යක්ෂකවරයාට මාසිකව රු. 90,000 බැගින් 2018 වර්ෂය සඳහා රු. 1,080,000ක් ගෙවා තිබුණද සේවයට පැමිණීම සනාථ කෙරෙන පැමිණීමේ ලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | එකඟ වේ. ඉදිරියේදී පැමිණීමේ ලේඛන නඩත්තු කිරීමට පියවර ගනු ඇත. | සේවයට පැමිණීම සනාථ කර ගැනීමෙන් පසු වැටුප් ගෙවීමට කළමනාකරණය කටයුතු කල යුතුය. |
| (ඇ) | ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් තුල ගෙවීම් වවුචර් පත් සියල්ල අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්‍ෂා සහිතව තබා ගත යුතුය. එසේම සියළුම වවුචර්පත් විගණනය සඳහා සම්පූර්ණ කර සුදානම් කර තැබීමට වවුචර් භාර නිලධාරියා වගබලා ගත යුතු වුවද මාගම්පුර වරාය කළමනාකරණ සමාගම 2017 වර්ෂයට අදාළ රු. 29,975,094 ක වටිනාකමින් යුත් වවුචර්පත් 104 ක් සහ 2018 වර්ෂයට අදාල රු. 4,543,395 ක වටිනාකමින් යුත් වවුචර් පත් 19 ක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | එකඟ වේ. මාගම්පුර වරාය කළමනාකරණ සමාගම ඇවර කර චීන සමාගමකට බදු දීමට ගනු ලබන ලද තීරණයත් සමග මාගම්පුර වරාය සතුව තිබූ සියළු ලිපි ලේඛන (වවුචර් ආදිය) කොළඹ වරායේ මහපොළ වෙත ලොරි වල පටවා ඉතා අපරීක්ෂාකාරී ලෙස ප්‍රවාහනය කර ඇති බව දැන ගැනීමට ලැබිණි. එමෙන්ම මෙම ලිපි ලේඛනවල භාරකාරීත්වය සඳහා කිසිදු ස්ථිර සේවකයෙක් එවකට නොසිටි බැවින් මෙම ලිපි ලේඛනවල වගකීම කිසිවෙකුත් භාරගනු නොලැබේ. 2019.04.01 දින ලැබූ නව පත්වීමත් සමග අප වෙත භාර දුන් ලිපි ගොනු වල තිබූ වවුචර් පත් සියල්ල විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර මෙම වවුචර් සොයා ගැනීමට නොමැති බව තව දුරටත් දන්වා සිටිමි. | සමාගමේ ලිපි ලේඛණ හා වත්කම් වරාය අධිකාරිය වෙත ගෙනඒමේදී එම කටයුතු විධිමත්ව හා ක්‍රමානුකූලව සිදු කර නොමැති හෙයින් ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය.<br><br>එසේම මෙම කටයුතු විධිමත්ව හා සැලකිලිමත්ව සිදු කිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම මව් සමාගමේ හා රේඛීය අමාත්‍යාංශයේද වගකීම වේ. |